ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

## <u>දිවයින පුරා සිසු සිසුවියන් 300 දෙනෙකුට මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව පිරිනැමේ</u>

මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා සහ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ඒ. අරවින්ද් කුමාර් මහතා 2023 මැයි 18 වන දින අධ්‍යාපන අමාත්‍යාංශයේ පැවති විශේෂ උත්සවයක දී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ම නියෝජනය කරමින් උසස් පෙළ සිසු සිසුවියන් 300 දෙනෙකුට මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව ප්‍රදනය කළහ.

2. මෙම ශිෂ්‍යත්වය යටතේ සෑම දිස්ත්‍රික්කයකම ප්‍රථම ස්ථාන හය දිනාගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දක්ෂතාවය සහ අවශ්‍යතාවය මත පදනම්ව සෑම මසක ම ශ්‍රී ලංකා රුපියල් 2,500/- ක මුදලක් ලබා දේ. මෙම වසරේ දී 2021-2022 වසරේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කණ්ඩායම් දෙකකට එකවර මෙම ශිෂ්‍යත්වය පිරිනැමේ.

3. ලබාගත් ජයග්‍රහණයන් වෙනුවෙන් සිසු සිසුවියන්ට සුබ පැතුම් එක් කළ මහ කොමසාරිස්තුමා දෙරටෙහි ම තරුණ පරපුරේ අනාගතය දීප්තිමත් කිරීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ද්විපාර්ශවික සහයෝගීතාවයේ වැදගත්කම අවධාරණය කළේය. එතුමා බුදුන් වහන්සේ සහ මහත්මා ගාන්ධිතුමා පිළිබඳව ද සඳහන් කළ අතර මහත්මා ගාන්ධිතුමාගේ පරමාදර්ශයන් සීඝ්‍රයෙන් වෙනස් වන නූතන ලෝකයට ද වලංගු වන බව පැවසීය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සමීප සංස්කෘතික බැඳීම් අවධාරණය කළ එතුමා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වේගවත් වෙනස්කම් සිදුවන ඉන්දියාවේ පවතින අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගන්නා ලෙස තරුණ සිසු සිසුවියන්ගෙන් ඉල්ලා සිටියේය. ශ්‍රී ලංකාවේ තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්

ඉන්දියාවට සහ ශ්‍රී ලංකා වට විශාල ශක්තියක් වනු ඇති බවට එතුමා විශ්වාසය පළ කළේය.

4. අමාත්‍ය ආචාර්ය ප්‍රේමජයන්ත මහතා මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව පමණක් නොව වෙනත් විවිධ ශිෂ්‍යත්ව ද IITs ඇතුළු ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ අධ්‍යාපන ආයතනයන් හි ලබා දෙන අවස්ථාවන් වෙනුවෙන් ද ඉන්දීය රජයට ස්තුතිය පළ කළේය. මෙම වැඩසටහන් ශ්‍රී ලංකා වේ මානව සම්පත් සංවර්ධනය උදෙසා වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව එතුමා පැවසීය. එසේම, එතුමා මහත්මා ගාන්ධිතුමා අධ්‍යාපනය සම්බන්ධයන් දැරූ අදහස් වලට සිය උපහාරය පළ කළේය. තවද, ශ්‍රී ලංකාවේ පාසල් දරු දැරියන් සඳහා පෙළ පොත් මුද්‍රණයට ලබා දුන් සහයෝගයට ද එතුමා ඉන්දීය රජයට කෘතවේදිත්වය පළ කළේය.

5. ඉන්දියානු රජය ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මහත්මා ගාන්ධි ශිෂ්‍යත්වයන්ට අමතරව වාර්ෂිකව ඉංජිනේරු, තාක්ෂණ, කලා, විද්‍යා, දේශීය වෛද්‍ය වැනි විවිධ ක්ෂේත්‍රයන් හි ශිෂ්‍යත්ව 210ක් පමණ පිරිනමයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවකයන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා ITEC යෝජනා ක්‍රමය යටතේ පූර්ණ ශිෂ්‍යත්ව 400කට වැඩි සංඛ්‍යාවක් ද පිරිනමනු ලබයි. මෙයට අමතරව, Study in India වැඩසටහන යටතේ ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථා දහස් ගණනක් ද විවෘතව පවතී.

***

කොළඹ
2023 මැයි 22